# Carter's සමාජීය අනුකූලතා ප්‍රතිපත්තිය

1865 වර්ෂයේ ආරම්භ වූ Carter's ව්‍යාපාරය අද වන විට ලොවම පිළිගත් ගුණාත්මක නිෂ්පාදනයන් තම පාරිභෝගිකයන් වෙත ලබාදෙමින් සමාජීය වගකීම් හා ආචාර ධර්මයන්ට අනුකූලව තම ව්‍යායාපාර කටයුතු කරගෙන යනු ලබන ලොව ප්‍රමුඛපෙලේ ආයතනයකි. අප විසින් අපගේ නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය මෙන්ම අපගේ සමාජීය ආචාර ධර්ම පද්ධතිය ප්‍රචලිත කිරීම වෙනුවෙන් අප සැපයුම්කරුවන් මෙන්ම නියෝජිතයන්ද ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය ගුණාත්මකව මෙන්ම අපගේ අචාර ධර්ම පද්ධතීන්ට අනුකූලව සිදුකරගෙන යාම අනිවාර්යවේ.

## නෛතික හා ආචාරධර්ම ප්‍රතිපත්ති

සියලුම තත්වයන් හා සැපයුම්කරුවන් ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන රටේ ඔවුන්ගේ කර්මාන්තයට අදාල නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව හා Carter's ආචාර ධර්ම පද්ධතියට අනුකූලව තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යායුතුවේ.

## මානව හිමිකම් / වෙනස්කමක් නොකිරීම

සියලු දෙනාගේ ශ්‍රමය සේවෙච්චවෙන් විය යුතුය. ළමා , බලයෙන් ලබා ගන්නා,බන්ධිත , බන්ධනාගාරගත හෝ පොරොන්දු ශ්‍රමය වෙනුවෙන් අප කිසිවිටකත් ඉඩක් ලබානොදේ. සියලුම ආයතන මූලික මානව අයිතිවසිකම් ආරක්ෂා කරගනිමින් තම ව්‍යාපාර කාර්යන් සිදුකල යුතු අතර කිසිම අවස්ථාවකදී තම සේවකයන්ගේ ජාතිය , ආගම් , ස්ත්‍රී පුරුෂ භාවය , දේශපාලන දර්ශනය මත වෙනස් ආකාරයකට සැලකීමක් සිදුනොකළයුතුය.

## ළමා ශ්‍රමය

අප අපගේ නිෂ්පාදන කටයුතු සඳහා කිසිම හේතුවක් මත ළමා ශ්‍රමය යොදාගැනීම අනුමත නොකරේ. එසේම අපගේ සැපයුම්කරුවන් ඔවුන්ගේ රටේ පවතින නිතිය අනුකූලව සේවයට බඳවා ගැනීමට නියම කර ඇති අවම වයස් මට්ටම පවත්වා ගත යුතු අතර වයස අවු 16 ට අඩු සේවකයන් සේවයේ යොදවා ගනු ලබන සැපයුම්කරුවන් සමග අප ගනුදෙනු කිරීමෙන් බැහැරවේ.

## වැඩකරන පැය ගණන හා අදාල ගෙවීම්

සැපයුම්කරුවන් රටේ පවතින නිතියට අනුකූලව නියම කර ඇති අවම වැටුප, අතිකාල , වැඩ කළහැකි උපරිම පැය ගණන , ප්‍රතිලාභ, සහ අනිකුත් ගෙවීම් වලට අදාල කොන්දේසි අනුව වැඩකරන සියලුම සේවක සේවිකාවන් සඳහා ගෙවීම් සිදුකල යුතුය. එසේම සතියක් වැඩ කිරීමේදී , අනිවාර්ය එක් දිනක නිවාඩුවක් ලබා දීම සඳහා ඇති නීතිය ඒකාකාරව පත්වාගෙන යා හැකි වන ලෙසට ආයතනයේ වැඩ කටයුතු සැලසුම් කල යුතුවේ.

## වැඩ පරිසරය

අප අපගේ වැඩකරන සේවක සේවිකාවන් සඳහා ආරක්ෂාකාරී , පිරිසිදු, සෞඛ්‍යය සම්පන්න හා ඵලදායි වැඩ පරිසරයක් පවත්වාගන යන අතර එය සැපයුම්කරුවන්ගෙන්ද බලාපොරොත්තුවේ. ආයතනය තුල සේවය කරන සියලුම සාමාජිකයනට ආරක්ෂාකාරී , සෞඛ්‍යය සම්පන්න , අවශ්‍යය ප්‍රථමාධාර පහසුකම් සලසන, වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුකරන , ගිනි ආරක්ෂක උපකරණ හා හදිසි ගිනි සඳහා පිටවීමේ දොරටු, සැපපහසු වැඩ පරිසරයක් , පිරිසිදු විවේකාගාර පහසුකම් සහ අවශ්‍යය අවස්ථාවන් සඳහා නේවාසිකාගාර පහසුකම් සලසා දෙනු ලබන සැපයුම්කරුවන් සමග පමණක් අප ගනුදෙනු කරනු ලැබේ. සෞඛ්‍යය සම්පන්න, උපද්‍රවයන්ගෙන් තොර වැඩ පරිසරයක් සහ තර්ජන , තැතිගන්වීම් හෝ හිංසා කිරීම් වලින් ආයතනය තුලසේවයකරන සාමජිකයෙනගේ කායික හෝ මානසික වදහිංසාවක් ඇතිකරවන විනය ප්‍රතිපත්තියක් අනුගමනය නොකරන, සැපයුම්කරුවන් පමණක් අප අපගේ නිෂ්පාදනයන්ගේ සැපයුම්කරුවන් ලෙස තෝරාගැනේ.

## සාමුහිකව එක්රැස්වීම

අප සේවකයන්ට ඇති ඕනෑම සංගමයකට සම්බන්ධ වීමේ හා සාමුහිකව එක්රැස්වීමේ අයිතිය සඳහා ගරු කරන අතර එය අපගේ සියලුම සැපයුම්කරුවන්ගෙන්ද, ඔවුන්ගේ රටේ නීතිරීති හා කොන්දේසි වලට අනුකූලව බලාපොරොත්තුවේ.

## පාරිසරික හා සමාජීය වගකීම්

අපගේ ව්‍යාපාර ක්‍රියාවලිය නිසා පරිසරයට හෝ සමාජයට මොනයම් හෝ අහිසි ප්‍රතිපලයක් සිදුවේනම් ඒ සඳහා ඉක්මන් පියවර ගැනීමට අප බැඳී සිටී. අප විසින් පවත්වාගෙන යනු ලබන පාරිසරික හා සමාජීය හිතකාමී ප්‍රතිපත්තිය අනුගමනය කරන, පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා ඇති ජාතික හා අන්තර්ජාතික කොන්දේසි , මගපෙන්වීම් හා අවශ්‍යයතා වලට අනුකූලව කටයුතු කරන සැපුම්කරුවන් පමණක් අප අපගේ සැපයුම්කරුවන් ලෙස තෝරාගැනේ.

ඉගෙනීමේ කටයුතු , සෞඛ්‍යය පිළිවෙත් හෝ අනිකුත් සමාජයට වැඩදායි වැඩසටහන් සඳහා අනුග්‍රහය දක්වන සැපයුම්කරුවන් අපගේ විශේෂ සැලකිල්ලට ලක්වේ.

## ආනයන අපනයන රෙගුලාසි

සියලුම සැපයුම්කරුවන් ඔවුන්ගේ රටට අදාලවන නීතිරීති හා රෙගුලාසි වලට අ නුකුල වියයුතුය. සැපයුම්කරුවන් විසින් සිදුකරන එක්සත් ජනපද රෙගු නීතිරීති ජාත්‍යයන්තර ගිවිසුම්, හෝ ජාත්‍යයන්තර නීතිවල ඇතුලත් , එනමුත් එමගින් සී මාවක් දක්වා නොමැති , භාණ්ඩ නිෂ්පාදිත රට පිළිබඳ වසන්කිරීම්, අසත්‍යය ලියවිලි ඉදිරිපත් කිරීම, ව්‍යාජ වීසා බලපත්‍ර ඉදිරිපත් කිරීම, අපනයන කරනු ලබන රටත් එක්සත් ජනපදය හෝ අපනයන කරනු ලබන භාණ්ඩ යවනු ලබන ගමනාන්ත රට සමග ඇතිකරගෙන ඇති Textile Quota Restraint ගිවිසුමට පටහැනි නොවන නැව්ගත කිරීම්, සම්බන්ධයෙන් අපගෙන් කිසිදු සමාවක් හෝ අවසරයක් එම අදාල සැපයු ම්කරුට හිමිනොවේ.

අප විසින් සැපයුම්කරුවන් වෙත ලබාදී ඇති අත්පොතෙහි භාණ්ඩ නැව්ගත කිරීමේදී හා කාටුන් සඳහා ලේබල් ඇලවීමේදී අනුගමනය කලයුතු ක්‍රියා පටිපටිය සවිස්තරාත්මකව දැක්වේ. එසේම එම අත්පොතට අනුව පහත සඳහන් කරුණු සම්බන්ධව අනුකූලතාවයකින් කටයුතු කිරීම ඉතා වැදගත්වේ.

- භාණ්ඩ පිළිබඳ විස්තර හා එහි නිෂ්පාදිත රට
- නැව්ගත කිරීමත් සමග යවනු ලබන ලියවිලි

## රහසිගතභාවය හා වෙළඳ නාමය

සැපයුම්කරුවන් අප සමග ගිවිසගෙන ඇති පරිදි , අප විසින් ඔවුන් වෙත ලබාදී ඇති භාණ්ඩ, මිලගණන් , හා පරිභෝගිකයින් පිළිබඳ රහසිගතභාවය ආරක්ෂා කිරීමටත් , අප වෙත යොමුකරන ලිඛිත පෙර දැ නුම්දීමකින් තොරව එම තොරතුරු හෙළිදරව් නොකිරීමටත් , ලිඛිත පෙර දැනුම්දීමක් නොමැතිව අපගේ වෙළඳ නාමය සහිත ඇගලුම් නැවත නිෂ්පාදනය හෝ වෙලදාම් නොකිරීමටත් සියලුම සැපයුම්කරුවන් බැදීසිටී.

## අතුරු කොන්ත්‍රාත්කරුවන්

යම් කිසි සැපයුම්කරුවෙකු අපගේ නිෂ්පාදන සඳහා අතුරු කොන්ත්‍රාත්කරුවන් යොදා ගන්නේනම් එම සියලුම අතුරු කොන්ත්‍රාත්කරුවෙකුම ඉහතින් සඳහන් ප්‍රතිපත්ති මාලාවට අනුකුල වියයුතු අතර එම අනුකුතාවය පිළිබඳ සම්පූර්ණ වගකීම සැපයුම්කරුවන් සතුවේ. එසේම එම අදාල අතුරු කොන්ත්‍රාත්කරුවන් වෙත නිෂ්පාදනය පිණිස අපගේ නිෂ්පාදනයන් යොමු කිරීමට පෙර ඔවුන් අපගේ සමාජීය අනුකූලතා ප්‍රතිපත්තියට අනුව ක්‍රියාකිරීම පිලිබදව සැපයුම්කරුවන් විසින් සහතික විය යුතුය. අතුරු කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ විස්තර අප වෙත ලබාදියයුතුවේ. අතුරු කොන්ත්‍රාත්කරුවන් ගේ ලැයිස්තුවේ වෙනසක් සිදුකිරීමට අවශ්‍යය නම් ඒ පිලිබදව අපගේ සමාජීය අනුකූලතාව පිළිබඳ සොයාබැලීමට පත්කර ඇති කාර්යමණ්ඩලය වෙත දැනුම්දිය යුතුය.

## පරීක්ෂණය කිරීමේ අයිතිය

අපගේ සැපයුම්කරුවන් මෙම සමාජීය අනුකූලතා ප්‍රතිපත්තිය අනුගමනය කරන ආකාරය පිලිබදව පරික්ෂා කිරීම සඳහා අප හෝ අප විසින් නම් කර ඇති තුන්වන පාර්ශව විගණන කණ්ඩායමක් , පෙර දනුදීමකින් හෝ එසේ නොමැතිව සැපයුම්කරුවන් වෙත යොමු කිරීමේ අයිතිය අප සතුවේ. එවැනි අවස්ථාවකදී යම් කිසියම් සැපයුම්කරුවෙකුට එම පරීක්ෂණයෙන් සමත් වීමට නොහැකි වුවහොත් ඉතාමත් ඉක්මනින්ම අප විසින් එම අදාල සැපයුම්කරු හට ලබාදී ඇති හා අනාගතයේ ලබාදීම නියමිත සියලුම ඇනුම් අවලංගු කරන අතරම අප විසින් එම සැපයුම්කරු හා ඔහුගේ අතුරු කොන්ත්‍රාත්කරුවන් සමග ඇති සම්බන්ධතාවයද අවසාන කරනු ලැබේ.